# මූලික දෙමළ පාඨමාලාව 2019/2020

පළමු අධ්‍යයන සැසියේ දී ඔබගේ පන්තිභාර ගුරුතුමා/තුමිය විසින් මෙම පොතෙහි අඩංගු දෑ ඔබට පැහැදිලි කර දෙනු ඇත. එම නිසා පළමු දින අධ්‍යයන සැසියට සහභාගි වීමේදී මෙම පොත කරුණාකර රැගෙන යන්න.

## අරමුණු

මෙම පාඨමාලාව සකස් කර ඇත්තේ ස්වයං අධ්‍යයනය සහ සතියකට වරක් පංති කාමර තුළ ඉගැන්වීමේ ක්‍රමය අනුවය.

මෙම පාඨමාලාවේ අරමුණ ලිවීම, කියවීම, කථනය සහ සවන්දීම යන ප්‍රධාන භාෂා කුසලතා සහ නිවැරදි ව්‍යාකරණ භාවිතය ප්‍රගුණ කිරීම ය. තවද රාජ්‍ය සහ පෞද්ගලික අංශවල රැකියාවල නියුතු වන්නන් හට තම රැකියා ස්ථානවල සාර්ථකව කටයුතු කිරීමට අවශ්‍ය වන දෙමළ භාෂා සන්නිවේදන හැකියාව වර්ධනය කිරීම කෙරෙහි ද මෙම පාඨමාලාවේ දී අවධානය යොමුකෙරේ. භාෂා ඉගැන්වීමේ සන්නිවේදන ක්‍රමය පදනම් කර සැලසුම් කළ විවිධ අභ්‍යාස හා ක්‍රියාකාරකම් වලින් සමන්විත මෙම පාඨමාලාව සිංහල භාෂාව තම ප්‍රථම භාෂාව ලෙස භාවිතා කරන්නන් සඳහා සැලසුම් කරන ලද්දකි. මෙම දෙමළ පාඨමාලාව අදියර දෙකකින් යුතු වේ.

(අ) TG -ආරම්භක පාඨමාලාව අවුරුදු 01 යි. (LSC 0203)

(ආ) මූලික පාඨමාලාව අවුරුදු 01 යි.

## ඉගැන්වීමේ ක්‍රමවේදය

මෙම පාඨමාලාව ස්වයං-අධ්‍යයනය සඳහා සැලසුම් කොට ඇති අතර අධ්‍යයන සඳහා මුද්‍රිත පොත් සපයනු ලැබේ. විද්‍යාර්ථීන්ගේ අධ්‍යයනයට සහාය වීම් වස් අඛණ්ඩ ව ඉගැන්වීම් සැසි ද පැවැත්වේ.

සතියකට වරක් පැය **03** ක් බැගින් වූ සැසි ප්‍රාදේශීය / අධ්‍යයන මධ්‍යස්ථානවල/ ඉගෙනුම් මධ්‍යස්ථානවල දී සති අන්තවල පැවැත්වේ.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් සැපයෙන පාඨමාලා පොත් හා මඟ පෙන්වීම් වලට අතිරේක ව පොත් පත් සඟරා ගුවන් විදුලි හා රූපවාහිනී වැඩ සටහන් උපයෝගී කොට ගැනීම අපේක්ෂා කෙරේ.

## ඇගයීම

විවෘත විශ්ව විද්‍යාලය මගින් පාඨමාලාව ඇගයීම සඳහා පහත දැක්වෙන ඇගයීම ක්‍රම **02** භාවිතා කරනු ලැබේ.

1. පාඨමාලා පැවැත්වෙන කාල සීමාව තුළ කරනු ලබන අඛණ්ඩ ඇගයීම (CA)

2. අවසාන පරීක්ෂණය (Final Examination)

දෙමළ පාඨමාලාවට අඛණ්ඩ ඇගයීම් (CA) **03** ක් ඇතුළත් වේ. මින් අඩු වශයෙන් අඛණ්ඩ ඇගයීම් **02** ට පෙනී සිට 40% හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා සිසුන්ට අවසාන පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැක.

අඛණ්ඩ ඇගයීම් සඳහා ලැබෙන ලකුණු වලින් ප්‍රතිශතයක් අවසාන ප්‍රතිඵලය සකස් කිරීම සඳහා යොදා ගනු ඇත.

එමනිසා අඛණ්ඩ ඇගයීම් **03** ටම පෙනී සිට හැකි උපරිම ලකුණු ලබා ගැනීමට උත්සාහ කළ යුතුය. අවසාන පරීක්ෂණය සඳහා ලිඛිත පරීක්ෂණයක් පැවැත්වේ.

ඔබට අඩුම වශයෙන් අඛණ්ඩ ඇගයීම් **02** කට සහභාගි වී අවශ්‍ය ලකුණු ලබා ගැනීමට නොහැකි වුවහොත් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් (eligibility) නොලැබී යනු ඇත.

## නැවත පාඨමාලාව හැදෑරීමට සිදුවන සිසුන් (Repeat Students)

ඔබට අඛණ්ඩ ඇගයීම් **02** කට පෙනී සිට අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට නොහැකි වුවහොත් ඔබට නැවත පාඨමාලාව හැදෑරීමට සිදුවන ශිෂ්‍යයෙක් (Repeat student) ලෙස සළකනු ඇත.

එවැනි සිසුන්ට අතිරේක පාඨමාලා ගාස්තුවක් ගෙවා නැවත පාඨමාලාව සඳහා ලියා පදිංචි වීමට සිදුවනු ඇත.

එමනිසා අධ්‍යයන සැසි සඳහා සහභාගි වී අඩුම වශයෙන් අඛණ්ඩ ඇගයීම් **02**කට පෙනී සිට අවශ්‍ය ලකුණු ප්‍රමාණය ලබා අවසාන පරීක්ෂණයට පෙනී සිටින ලෙස අවධාරණය කරනු ලැබේ. එවිට අමතර පාඨමාලා ගාස්තු ගෙවීමකින් තොරව ඔබට පාඨමාලාව සම්පූර්ණ කර ගත හැක.

## නැවත අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට සිදුවන සිසුන් (Re-sit students)

ඔබට අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය (eligibility) ලැබුනද, යම්කිසි හේතුවක් නිසා අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වුවහොත් නැවත අවසාන පරීක්ෂණයට (Re-sit students) පෙනී සිටීමට සිදුවනු ඇත. එවිට ඔබ ඉදිරි වසරේදි අවසාන පරීක්ෂණයට කැඳවීම සඳහා ශිෂ්‍ය භාවය වලංගු කර ගැනීමට ගාස්තුවක් ගෙවිය යුතුය.

**නමුත් ඔබට අධ්‍යයන සැසි වලට සහභාගි වීමට අවසර නොලැබේ.**

## කණ්ඩායම් අංක

ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණය සඳහා ලබා ගත් ලකුණු අනුව ඔබ කණ්ඩායමකට අනුයුක්ත කරනු ඇත.

එක් එක් කණ්ඩායමකට අයිති සිසුන්ගේ නාම ලේඛනයක් ප්‍රාදේශීය/අධ්‍යයන/ඉගෙනුම් මධ්‍යස්ථානවල දැන්වීම් පුවරුවල දක්වා ඇත. එය පළමු දිනයේම විමසා ඔබ අයත් කණ්ඩායමට සහභාගි විය යුතුය. ඔබට ලැබුනු කණ්ඩායම මාරු කර ගැනීමට අවසර දෙනු නොලැබේ.

## පාඨමාලාවෙන් ඉවත් වීම (Withdrawal from the Programme)

ඔබට යම්කිසි හේතුවක් නිසා පාඨමාලාවෙන් ඉවත් වීමට සිදුවුවහොත් ලිපියක් මගින් ලියා පදිංචි වූ දින සිට මාස 02ක් ඇතුලත ශිෂ්‍ය කටයුතු අංශයට ද එහි පිටපතක් අංශ ප්‍රධානි/ භාෂා අධ්‍යයන දෙපාර්තමේන්තුව වෙත ද ලැබීමට

